මගේ අංකය- S1/7/68 (VIII )

විගණකාධිපති දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල.

2018 ජුලි 24 දින

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරීන්ගේ හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සියළුම නිලධාරීන් වෙත,

**<u>අංක 03/2018 දරණ ඒකාබද්ධ සේවයේ 2019 වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය සම්බන්ධවයි.</u>**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COMS/Trans/වා.ස්.මා./2019 හා 2018.07.16 දිනැති ලිපිය හා බැඳේ. ( එම ලිපියේ පිටපතක් අමුණා ඇත)

02. ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලියේදී පැන නගින ප්‍රායෝගික ගැටළු නිරාකරණය කිරීම සඳහා නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරීන්ගේ හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ගේ දත්ත ලබා ගැනීම සඳහා මාර්ගගත මෘදුකාංගයක් භාවිතා කිරීමට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කර ඇත.

03. ඒ අනුව ඉහත සඳහන් සේවාවන් දෙකෙහි සියළුම නිලධාරීන් ඉහත ඇමුණුමෙහි සඳහන් උපදෙස් පරිදි කටයුතු කල යුතුය. එසේම තමා සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු ඇතුලත් කිරීම සෑම නිලධාරියෙකුගේම වගකීම වන අතර 2018.07.30 දිනට ප්‍රථම තම තොරතුරු යාවත්කාලීන කර අවසන් කල යුතුය.

04. 2019 වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට බලාපොරොත්තු වන හා නොවන සෑම නිලධාරියෙකුම මෙම ක්‍රමය යටතේ තොරතුරු ඇතුලත් කිරීම අනිවාර්ය වේ.

05. 2019 වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට බලාපොරොත්තු වන නිලධාරීන්ද මෙම මාර්ග ගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර එම අයදුම්පත් 2018.07.30 දිනට පෙර තම ආසන්නතම මාණ්ඩලික නිලධාරියා මඟින් ආයතන අංශයට එවීමට කටයුතු කල යුතු වේ.

06. ආයතන අංශය,ඉතා විශාල පිරිසකගේ පෞද්ගලික ලිපිගොනුවල අන්තර්ගත තොරතුරු සැපයීමට සිදුවීමේදී ඇතිවිය හැකි ප්‍රමාදයන් හා අපහසුතාවයන් මඟහරවා ගැනීමට නිලධාරීන් තමන් සතුව ඇති ලිපිවල පිටපත් උපයෝගී කරගෙන තොරතුරු ඇතුලත් කරන මෙන් තවදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

07. මෙ සම්බන්ධයන් මතුවන ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පමණක් පහත අංකය ඔස්සේ උපදෙස් ලබා ගත හැක.

- ආයතන අංශය - නදීෂා
  (රා. ක.ස. 111) 011-2887028-34 හෝ 3218

කේ.ඩබ්.අයි.එම්. කරුණාසේන
අධ්‍යක්ෂ (පාලන) (රා.ඉ.)
විගණකාධිපති වෙනුවට